# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2165/17 - 2020 මාර්තු මස 03 වැනි අඟහරුවාදා - 2020.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2020

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 16 වන වගන්තිය යටතේ ස්වාධීන කණ්ඩායම් විසින් ඇප මුදල් තැන්පත් කිරීම සහ ඒ ඒ දිස්ත්‍රික්කය සඳහා දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් නාමයෝජනා කළ යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව

ඉහත මැතිවරණය වෙනුවෙන් මැතිවරණ කොට්ඨාස සඳහා තෝරා පත්කර ගැනීමට නියමිත මන්ත්‍රීවරු සංඛ්‍යාව, නාම යෝජනා පත්‍රයක් මගින් නාම යෝජනා කළ යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව සහ ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් පහත උපලේඛනයේ දැක්වේ. පිළිගත් දේශපාලන පක්ෂ ඇප මුදල් තැන්පත් කළ යුතු නැත.

උපලේඛනය

| මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම | තෝරා පත්කර ගතයුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව | නාමයෝජනා පත්‍රයකට ඇතුළත් විය යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව | ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල |
|---|---|---|---|
| 01. කොළඹ | 19 | 22 | රු. 44,000/- |
| 02. ගම්පහ | 18 | 21 | රු. 42,000/- |
| 03. කළුතර | 10 | 13 | රු. 26,000/- |
| 04. මහනුවර | 12 | 15 | රු. 30,000/- |
| 05. මාතලේ | 05 | 08 | රු. 16,000/- |
| 06. නුවරඑළිය | 08 | 11 | රු. 22,000/- |
| 07. ගාල්ල | 09 | 12 | රු. 24.000/- |
| 08. මාතර | 07 | 10 | රු. 20,000/- |

1A - G 31976 — 92 (2020/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

| මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම | තෝරා පත්කර ගතයුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව | නාමයෝජනා පත්‍රයකට ඇතුළත් විය යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව | ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල |
|---|---|---|---|
| 09. හම්බන්තොට | 07 | 10 | රු. 20,000/- |
| 10. යාපනය | 07 | 10 | රු. 20,000/- |
| 11. වන්නි | 06 | 09 | රු. 18,000/- |
| 12. මඩකලපුව | 05 | 08 | රු. 16,000/- |
| 13. දිගාමඩුල්ල | 07 | 10 | රු. 20,000/- |
| 14. ත්‍රිකුණාමලය | 04 | 07 | රු. 14,000/- |
| 15. කුරුණෑගල | 15 | 18 | රු. 36,000/- |
| 16. පුත්තලම | 08 | 11 | රු. 22,000/- |
| 17. අනුරාධපුරය | 09 | 12 | රු. 24,000/- |
| 18. පොළොන්නරුව | 05 | 08 | රු. 16,000/- |
| 19. බදුල්ල | 09 | 12 | රු. 24,000/- |
| 20. මොණරාගල | 06 | 09 | රු. 18,000/- |
| 21. රත්නපුර | 11 | 14 | රු. 28,000/- |
| 22. කෑගල්ල | 09 | 12 | රු. 24,000/- |

02. යාපනය සහ කිළිනොච්චිය යන පරිපාලන දිස්ත්‍රික්ක අයත් වන යාපනය මැතිවරණ කොට්ඨාසය සඳහා යාපනය දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරයා තේරීම්භාර නිලධාරියා වේ. මන්නාරම, වවුනියාව සහ මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්ක අයත් වන වන්නි මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියා වන්නේ වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරයා ය. දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියා, අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරයා ය. අනෙකුත් ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්ක අයත් වන මැතිවරණ කොට්ඨාස වල දිසාපතිවරු/දිස්ත්‍රික් ලේකම්වරු එම මැතිවරණ කොට්ඨාස වල තේරීම්භාර නිලධාරීන් ලෙස කටයුතු කරනු ඇත.

03. ඇප මුදල් තැන්පත් කිරීම, පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තිය යටතේ මැතිවරණ පැවැත්වීම සඳහා දින නියම කරමින් නිවේදනය පළ කරනු ලැබූ දින සිට ස්වාධීන කණ්ඩායම් ඒ ඒ නාමයෝජනා පත්‍ර අදාළ තේරීම්භාර නිලධාරී වෙත බාර දීමට අතර වූ කාලය තුළ, ඒ ඒ කණ්ඩායම විසින් නාමයෝජනා ඉදිරිපත් කරන ලද එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් රුපියල් දෙදහස බැගින් ගණන් බලා ලද මුදලක් වලංගු මුදලින් තේරීම්භාර නිලධාරී වෙත සතියේ වැඩ කරන දින වල සාමාන්‍ය කාර්යාල වේලාව තුළ තැන්පත් කළ යුතු ය.

04. ඇප මුදල් බාර ගැනීම සඳහා අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ හෝ වැඩපිළිවෙල යොදා ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය හා උපදෙස් පරිදි,

සමන් ශ්‍රී රත්නායක,
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

2020 මාර්තු මස 03 වැනි දින,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.